"කාර්යසමර්තාවයෙන් යුත් ඵලදායී පළාත් සභා රාජ්‍ය සේවයක්"

ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ஊவா மாகாண சபை அரசாங்க சேவை ஆணைக்குழு

Uva Provincial Council Public Service Commission

අංක 14/4, පිලිපොතගම පාර,පිංඅරාව බදුල්ල. இல 14/4,பீலிபொத்தகம வீதி,பிங்கராவ,பதுளை. No 14/4,Peelipothagama Road, Pinarawa,Badulla.

මගේ අංකය / எனது இல / My No. 3/1B/3/03-6

ඔබේ අංකය / உமது இல / Your No. .....

දිනය / திகதி / Date 2026.11.10

ඌව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ,
ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
රත්වත්ත මාවත,
බදුල්ල.

ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක සේවයේ සේවා පළපුරුද්ද හා කුසලතාවය මත විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවීම

2015.09.01 දින සිට ක්‍රියාත්මක ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියෙහි **10.3.3** ප්‍රකාරව, කෘෂිකර්ම උපදේශක විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති කෘෂිකර්ම උපදේශක I ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. එකී අභ්‍යන්තර නිවේදනය, ආදර්ශ අයදුම්පත හා ආවරණ ලිපිය www.psc.up.gov.lk යන වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක.

02. එකී නිවේදනය මඟින් කැඳවා ඇති අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය **2026.11.27** වන අතර, මේ සම්බන්ධයෙන් ඔබ ආයතනයේ /දෙපාර්තමේන්තුවේ/අමාත්‍යාංශයේ සේවය කරන නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත්, මේ සඳහා අයදුම්කිරීමට කැමති හා අයදුම්පත් කැඳවීමේ නිවේදනය ප්‍රකාරව සුදුසුකම් සපුරන අය වෙතොත් නියමිත ආකෘතිය ප්‍රකාරව අයදුම්පත්‍රය සකස් කර අදාළ නිර්දේශ සහිතව අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය වන 2026.11.27 වන දිනට හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබීමට සලස්වන ලෙසත් කාරුණිකව දන්වමි.

03. තවද, මෙම තනතුර සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවන් ඌව පළාත් සභා රාජ්‍ය සේවය යටතේ පත්වීම් ලබා ඇති/ ඌව පළාත් සභා රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කර ඇති අය බවට හා 2015.09.01 දින සිට ක්‍රියාත්මක ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියට අන්තර්ග්‍රහණය කර ඇති සහ මෙම තනතුර සඳහා අයදුම් කිරීමට සෑම අතින්ම සුදුසුකම් ලබා ඇති බවට අදාළ ආයතන ප්‍රධානීන්/දෙපාර්තමේන්තු ප්‍රධානීන් පෞද්ගලිකවම සහතික කර තිබිය යුතුය.

04. එසේම උක්ත අයදුම්පත්‍රය සමඟ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 8/98(I) ප්‍රකාර කාර්යය සාධන ඇගයීම් වාර්තා, රැකියා විස්තරය, වාර්ෂික වැටුප් වැඩිවීම් ගෙවීම් සඳහා නියෝග, පඩි වැඩි කිරීම් සහතික පත්‍ර ආදී ලිපිලේඛන ඇතුළත් කර නිවැරදිව යාවත්කාලීන කරන ලද එම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු මා වෙත යොමු කරන මෙන් ද සුදුසුකම් සපුරා ඇති සියළුම නිලධරයන් දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ද කාරුණිකව දන්වා සිටිමි.

(එල්.ඒ. සොමරත්න)
ලේකම්
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

පිටපත්

01. ඌව පළාතේ ප්‍රධාන ලේකම් - කරුණික දැ.ගැ.ස.
02. ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම් - දැ.ගැ.ස.
03. ලේකම්, ඌව පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය - දැ.ගැ.ස හා අ.කා.ස

ගරු සභාපතිතුමා / கௌ.தவிசாளர் / Hon. Chairman 055 - 2222150

ලේකම් / செயலாளர் / Secretary 055 - 2223482

පොදු / பொது / General 055 - 2222400
055 - 2231460 (Exam Unit)
Fax - 055-2232858
Website - www.psc.up.gov.lk

සහකාර ලේකම් / உதவி செயலாளர் / Asst Secretary 055 - 2225148
055 - 2232857

පරිපාලන නිලධාරී / நிர்வாக உத்தியோகத்தர் / Administrative Officer 055 - 2222400

ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ
කෘෂිකර්ම උපදේශක විශේෂ ශ්‍රේණියට

සේවා පළපුරුද්ද හා කුසලතාවය මත උසස් කිරීම

2015.09.01 දින සිට ක්‍රියාත්මක ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියෙහි විධිවිධාන ප්‍රකාරව ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක විශේෂ ශ්‍රේණියේ පහත පරිදි එක් එක් වර්ෂවල දෙසැම්බර් මස 31 දිනට පුරප්පාඩුව පවතින තනතුරු 06ක් සඳහා සේවා පළපුරුද්ද හා කුසලතාවය මත උසස් කිරීමට සුදුසුකම්ලත් නිලධරයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

වර්ෂය	පුරප්පාඩු ගණන
2017	01
2018	02
2020	01
2021	01
2024	01
එකතුව	06

02. අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ඒ ඒ පුරප්පාඩු වර්ෂයට අදාළව බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියෙහි 10.3.3.1 හි සඳහන් සියලුම සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධරයන් පමණි. ඒ ඒ වර්ෂවලට අදාළව සුදුසුකම් සම්පූර්ණ කර ඇත්නම් අදාළ වර්ෂවලට වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

03. **සුදුසුකම්**

I. අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN-03) සේවා ගණයේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හය (06)ම උපයාගෙන තිබීම.
II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
IV. නෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

04. **බඳවා ගැනීමේ ක්‍රමය**

I. මෙම නිවේදනයට අනුව ඇමුණුමේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාරව විධිමත් පරිදි අයදුම් කරනු ලබන අයදුම්කරුවන් සඳහා ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සේවා පළපුරුද්ද හා කුසලතාවය සඳහා ලකුණු ලබා දෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අදාල සෙසු අවශ්‍යතාවයන්ද සම්පූර්ණ කර ඇති බවට පත් කිරීම බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කර තහවුරු කර ගැනීමෙන් අනතුරුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ කුසලතාවයේ අනුපිළිවෙල මත සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ.

II. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු ලබන්නේ උසස් කිරීමේ පරිපාටියෙහි ඇමණුම් 07 හි සඳහන් ආකාරයට පහත පරිදි වේ.

ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්

ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර	උපරිම ලකුණු ප්‍රමාණය
<u>සේවා පළපුරුද්ද</u> අදාල මූලික සුදුසුකම් ඉක්මවා සපුරා ඇති සක්‍රීය හා සතුටුදායක පළමු ශ්‍රේණියේ වසරක සේවා කාලයකට ලකුණු 05 බැගින් උපරිම වසර 10ක් සඳහා	50
<u>කුසලතාවය</u> • කාර්යසාධනය (ආසන්න වසර පහ සඳහා) • ඉතා හොඳයි - 03 • හොඳයි - 02 • සතුටුදායකයි - 01	15
<u>පරිගණක සාක්ෂරතාවය(සහතික මඟින් සනාථ කළ යුතුවේ)</u> • මාස 06 හෝ ඊට වැඩි පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම 03 • මාස 06ට අඩු මාස 03 හෝ ඊට වැඩි පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම 02 • මාස 03ට අඩු මාසයක් හෝ ඊට වැඩි පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම 01 • මාසයකට අඩු කාලසීමාවක පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම 0.5	03
<u>ඉංග්‍රීසි දැනුම</u> • අ.පො.ස.(සා.පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂයය හැර අනෙකුත් විෂයයන් එකක් හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා සමත්ව තිබීම 01 • අ.පො.ස.(උ.පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව විෂයයක් වශයෙන් හදාරා සමත්ව තිබීම 01 • අ.පො.ස.(උ.පෙළ) විභාගයට අදාළ එක් විෂයක් හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා සමත්ව තිබීම 01 • වෙනත් ඩිප්ලොමාවක්, උපාධියක් හෝ පශ්චාත් උපාධියක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් සම්පූර්ණ කර තිබීම 01 • ඉංග්‍රීසි ඩිප්ලෝමාවක් ලබා තිබීම 01	03
<u>කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ වෘත්තීය සුදුසුකම්</u> • සහතික පත්‍ර 01 • ඩිප්ලෝමා (බඳවාගැනීමේ ඩිප්ලෝමාව හැර) 02 • විශේෂ පන්තියට උසස් කිරීමේ විභාගය සමත් වීම 03 • කෘෂිකර්මය පිළිබඳ මූලික උපාධිය 04 • කෘෂිකර්මය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව 05 • කෘෂිකර්මය පිළිබඳ පශ්චාත් උපාධිය 06	06
රැකියා ක්ෂේත්‍රයට අදාළව සති දෙකක් හෝ ඊට වැඩි පුහුණුවීම් වලට සහභාගී වීම වෙනුවෙන් එක් පුහුණුවකට 01 බැගින්	03
බිබිල හෝ ඔක්කම්පිටිය ගොවිපල වල ගොවිපල කළමනාකරු ලෙස සේවය කිරීම (වසරකට සේවා කාලයක් සඳහා ලකුණු 01 බැගින්)	02
• පර්යේෂණ පත්‍රිකා හෝ ප්‍රකාශන කිරීම (එකක් සඳහා ලකුණු 01 බැගින්) • පුවත්පත්/සඟරා හෝ ප්‍රකාශන සඳහා ලිපි ඉදිරිපත් කිරීම (එක් ලිපියකට ලකුණු 0.2 බැගින්)	05

රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වශයෙන් එළිදක්වන ලද නව නිපැයුම් හා නව තාක්ෂණය	05
සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන කුසලතාවය • පෞරුෂත්වය 02 • අවධානම් කළමනාකරණය 02 • සන්නිවේදන කුසලතාවය 02 • ධනාත්මක චින්තනය 02	08
එකතුව	100

05. **අයදුම්පත් යොමු කිරීම**

මෙම නිවේදනය ප්‍රකාරව සුදුසුකම් සපුරා ඇති නිලධරයන් මේ සමග අමුණා ඇති ආදර්ශ අයදුම්පත (අයදුම්පත www.psc.up.gov.lk ඔස්සේද බාගත කළ හැකිය.) ප්‍රකාරව සැකසූ අයදුම්පත් නිවැරදිව සම්පූර්ණ කර තම ආයතන ප්‍රධානියා මගින් 2026.11.27 දින හෝ එදිනට පෙර ලැබෙන පරිදි "ලේකම්, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 14/4, පිලිපොතගම පාර, පිංඅරාව, බදුල්ල." යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "කෘෂිකර්ම උපදේශක විශේෂ ශ්‍රේණියට උසස් කිරීම" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය. එදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාර ගනු නොලබන අතර, අයදුම්පත් අස්ථානගත වීම හෝ ප්‍රමාද වීම සම්බන්ධයෙන් වන පැමිණිලි භාර ගනු නොලැබේ.

06. නිසි පරිදි සම්පූර්ණ කර නොමැති අයදුම්පත් හා මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. මෙම තනතුර සඳහා බඳවා ගැනීම හෝ නොගැනීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව සම්බන්ධ අවසාන තීරණය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

08. මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ පිළිබඳ පැහැදිලි කිරීම්/ තීරණය කිරීම් ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් සිදු කරනු ඇත.

කොමිෂන් සභාවේ නියමය පරිදි,

එල්.ඒ. සොමරත්න
ලේකම්
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

2026.11. 10 දින,
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
බදුල්ල.

පුරප්පාඩු වර්ෂය -

2017	2018	2020	2021	2024

(අදාළ වර්ෂ X යොදන්න)

2015.09.01 දින සිට ක්‍රියාත්මක ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක බඳවා ගැනීමේ පරිපාටියෙහි 10.3.3 ප්‍රකාරව කෘෂිකර්ම උපදේශක I ශ්‍රේණියේ නිලධාරීන් සේවා පළපුරුද්ද හා කුසලතාවය මත කෘෂිකර්ම උපදේශක විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

01. 1.1 මුලකුරු සමග නම :.....

1.2 සම්පූර්ණ නම :.....

02. 2.1 වර්තමාන සේවා ස්ථානය :.....

2.2 සේවා ස්ථානයේ ලිපිනය :.....

.....

2.3 රාජකාරී දුරකථන අංකය

03. 3.1 පෞද්ගලික ලිපිනය :.....

.....

3.2 ජංගම දුරකථන අංකය

04. 4.1 ස්ත්‍රී/පුරුෂ භාවය

ස්ත්‍රී - 1
පුරුෂ - 2

4.2 උපන් දිනය : වර්ෂය : මාසය දිනය :

05. ජාතික හැඳුනුම්පත් අංකය :

06. දැනට දරණ තනතුර

6.1 තනතුර හා ශ්‍රේණිය :.....

6.2 මුල් පත්වීමේ දිනය :.....

6.3 පත්වීම් ලිපියේ අංකය හා දිනය :.....

07. 7.1 කෘෂිකර්ම උපදේශක I ශ්‍රේණියට පත් වූ දිනය :.....

7.2 උසස් කිරීමේ ලිපියේ අංකය හා දිනය :.....

08. 8.1 ඌව පළාත් රාජ්‍ය සේවයේ පත්වීමක් නොවන්නේ නම් ඌව පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කර තිබේද? ඔව්/නැත/අදාළ නොවේ

8.2 ඔව් නම් අන්තර්ග්‍රහණය කරන ලද ලිපියේ අංකය හා දිනය :.....

09. තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයන් සමත් වී/නිදහස් වී තිබේද ? : ඔව් /නැත

සමත් වූ/නිදහස් වූ දිනය : .....

10. 10.1 සම්පූර්ණ කර ඇති පරිගණක පුහුණු විස්තර : .....
.....
.....
.....

10.2 ඉංග්‍රීසි දැනුම (අ.පො.ස.සා.පෙළ/ අ.පො.ස.උ.පෙළ/ඩිප්ලෝමා/උපාධි/පශ්චාත් උපාධි) :.....
.....
.....
.....

10.3 සම්පූර්ණ කර ඇති වෘත්තීය සුදුසුකම් (ඩිප්ලෝමා/උපාධි/ශාස්ත්‍රපති උපාධි) : .....
.....
.....
.....

10.4 රැකියා ක්ෂේත්‍රයට අදාළ පුහුණු පිළිබඳ විස්තර: .....
.....
.....
.....

10.5 බිබිල/ඔක්කම්පිටිය ගොවිපළ කළමනාකරු ලෙස සේවය කර ඇත්නම් ඒ පිළිබඳ විස්තර :.....
.....
.....

10.6 පර්යේෂණ පත්‍රිකා/පුවත්පත් සහරා හෝ ප්‍රකාශන පිළිබඳ විස්තර: .....
.....
.....

10.7 රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වශයෙන් එළිදක්වන ලද නව නිපැයුම් හා නව තාක්ෂණය පිළිබඳ විස්තර : .....
.....
.....

11. කෘෂිකර්ම උපදේශක I ශ්‍රේණියේ සේවා කාලය තුළ වැටුප් වර්ධක විලම්භනය කර තිබේද? .....

එසේ නම් ඒ පිළිබඳ තොරතුරු පහතින් දැක්වෙන කොටුවෙහි සඳහන් කරන්න.

අනු අංකය	විලම්භනය කරන ලද වැටුප් වර්ධකයට අදාළ වර්ෂය	විලම්භනය කිරීමට හේතුව	පෞද්ගලික ලිපිගොනුවෙහි පිටු අංකය

12. කෘෂිකර්ම උපදේශක I ශ්‍රේණියේ වසර 06ක සතුටුදායක සේවා කාලය සම්පූර්ණ කළ දිනය : .....

13. පුරප්පාඩු දිනට පූර්වාසන්නතම වසර 05ක් තුළ කෘෂිකර්ම උපදේශක I ශ්‍රේණියේ කාර්යය සාධන ඇගයීම හා වැටුප් වර්ධක උපයා ගැනීම පහතින් දැක්වෙන කොටුවෙහි සඳහන් කරන්න.

අනු අංකය	වර්ෂය	කාර්යය සාධන ඇගයීම (ඉතා හොඳයි/හොඳයි/සතුටුදායකයි/අසතුටුදායකයි)	පිටු අංකය	වැටුප් වර්ධක උපයා ගෙන තිබේද?	පිටු අංකය

14. ඔබට විරුද්ධව විනයානුකූලව කටයුතු කර තිබේද /කටයුතු කිරීමට අදහස් කර තිබේද? ඔව් / නැත
"ඔව්" නම් ඒ පිළිබඳ විස්තර පහත සඳහන් කරන්න.

.....

.....

.....

.....

.....වන මා අකාර්යක්ෂමතාවය නිසා විශ්‍රාම ගැන්වීමට කටයුතු අරඹා නොමැති බවත්, මට විරුද්ධව පවත්නා හෝ ඇතිවෙතැයි අදහස් කරන විනයානුකූල ක්‍රියාමාර්ග නොමැති බවත් ප්‍රකාශ කරමි. තවද, ඉහත 1-14 දක්වා මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, දැන දැනම සැලකිය යුතු කිසිවක් සඟවා නොමැති බවත් සහතික කරමි. එම තොරතුරු අසත්‍ය හෝ සාවද්‍ය බව හෙලිවුවහොත් මෙම තනතුරට මාගේ හිමිකම නොසලකා හැරීමටද, මට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට ද හැකි බව දනිමි.

දිනය :..... .....

අයදුම්කරුගේ අත්සන

අත්සන සහතික කිරීම

මාගේ කාර්යාලයේ කෘෂිකර්ම උපදේශක I ශ්‍රේණියේ නිලධාරියෙකු/නිලධාරිණියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ..... මහතා / මහත්මිය / මෙනවිය ..... වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව සහතික කරමි.

.....

සහතික කරන්නාගේ අත්සන සහ නිල මුද්‍රාව

නම :.....

පදවි නාමය :.....

ලිපිනය :.....

.....

දිනය :.....

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

I. මාගේ දෙපාර්තමේන්තුවේ සේවය නියුතු ..... මහතා /මහත්මිය / මෙනවිය ඌව පළාත් කෘෂිකර්ම උපදේශක I ශ්‍රේණියේ නිලධාරියෙකු / නිලධාරිනියක වන බවත්,

II. ඔහු/ඇය විසින් මෙම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති විස්තර නිවැරදි දැයි පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්,

III. ඔහු/ඇය ..... 01.01 වන දිනට පූර්වාසන්න අවුරුදු 06 ක කාලය තුළ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත් හා එම කාලය තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බවත්,

IV. ඔහු/ඇය ..... 01.01 වන දිනට කෘෂිකර්ම උපදේශක I ශ්‍රේණියේ වසර හයක (06) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බවත්,

V. ඔහු/ඇය ..... 01.01 දිනට පෙරාතුව වූ වසර 06ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇති බවත්,

VI. ඔහුට/ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කර නොමැති බවත්, විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් මම සහතික කරමි.

.....
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන සහ නිල මුද්‍රාව

නම :.....
පදවි නාමය :.....
ලිපිනය :.....
.....
දිනය :.....

අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය

ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක I ශ්‍රේණියේ නිලධාරියෙකු/ නිලධාරිනියක වන ..... මහතා / මහත්මිය / මෙනවිය විසින් කෘෂිකර්ම උපදේශක විශේෂ ශ්‍රේණියේ තනතුර සඳහා ඉදිරිපත් කර ඇති අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

.....
අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන සහ නිල මුද්‍රාව

නම :.....
පදවි නාමය :.....
ලිපිනය :.....
.....
දිනය :.....